ඔබ මෙලොවෙහි සරල ව ජීවත් වන්න. අල්ලාහ් ඔබට ප්රිය කරනු ඇත. ජනයා අතර තිබෙන දෑහි ඔබ සරල ව ජීවත් වන්න. ජනයා ඔබට ප්රිය කරනු ඇත.

සහ්ල් ඉබ්නු සඃද් අස්-සාඉදීය්යි (රළියල්ලාහු අන්හු) තුමා විසින් වාර්තා කරන ලදී. මිනිසෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පැමිණ: අල්ලාහ්ගේ දූතයාණනි, එය
මා ඉටු කළ විට අල්ලාහ් මට ප්රිය කරන එමෙන්ම මිනිසුන් ද මට ප්රිය කරන ක්රියාවක්
පෙන්වා දෙන්නැ’යි විමසා සිටියේය. “එවිට එතුමාණෝ: ‘ඔබ මෙලොවෙහි සරල ව ජීවත් වන්න. අල්ලාහ් ඔබට ප්රිය කරනු ඇත. ජනයා අතර තිබෙන දෑහි ඔබ සරල ව ජීවත් වන්න. ජනයා ඔබට ප්රිය කරනු ඇත.”
[පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත]

යම් ක්රියාවක් කළ විට එය අල්ලාහ්ගේ ආදරයට හා මිනිසුන්ගේ ආදරයට හේතුවන ක්රියාවක් වෙත මග පෙන්වන මෙන් මිනිසෙක් නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා වෙත පැමිණ ඉල්ලා සිටියේය. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා අල්ලාහ්ගේ ආදරය හා මිනිසුන්ගේ ආදරයට හේතුවක් වන ක්රියාවක් වෙත ඔහුට මග පෙන්වූහ. එවිට නබි (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) තුමා “මෙලොවෙහි ඔබ සරළව සිටින්න” යැයි පැවසූහ. එනම්: ඔබට අවශ්ය දෑ හැර වෙනත් දෑ අපේක්ෂා නොකරන්න. අමතර දෑ හා මතුලොවට ප්රයෝජවනත් නොවන දෑ අතහැර දමන්න. ඔබේ දහමට හිංසා පමුණුවන දැයින් ඔබ ප්රවේසම් වන්න. මෙලොවෙහි නුඹ ජනයා ප්රිය කරන දෑහි සරළව කටයුතු කරන්න. ඔබ අතර හා ඔවුන් අතරින් කිසිවකු අතර යම් වගකීමක් හෝ ගිවිසුම් අතරින් ගිවිසුමක් හෝ වී නම් නබි වදනෙහි පැමිණි ඇති පරිදි කටයුතු කරන්න. “විකුණන විට අවසරය දෙන මිලදී ගන්නා විට අවසරය දෙන තීන්දු කරන විට අවසරය දෙන තීන්දු ලබන විට අවසරය දෙන මිනිසාට අල්ලාහ් කරුණා කරත්වා.” එය ජනයා අබියස ආදරයට ලක්වන අතරම අල්ලාහ් අබියස කරුණා කරනු ලබන්නක් බවට පත්වනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/4307